# බුදුසරණ

ධර්ම භාණ්ඩාගාරයක් - සාරධර්ම සංග්‍රහයක් | www.budusarana.lk | Email:budusarana@lakehouse.lk
ශ්‍රී බුද්ධ වර්ෂ 2566 ක් වූ ඉල් අව අටවක පෝදා 2022 නොවැම්බර් 16 බදාදා BUDUSARANA WEDNESDAY NOVEMBER 16, 2022
ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. 57 කාණ්ඩය, 22 පත්‍රය, පිටු 10 ආරම්භය 1965-06-13



කූට වාණිජ ජාතක කතාව ඇසුරිනි

# සැක සංකා නැති ජීවිතයකට සීලය

**කුරුවුරු කවර ආකාරයකින් කළත් ප්‍රාණඝාතාදී අකුසල් සැමටම දුක් විපාක එක සේ ලබා දෙන්නේ ය. සීලා දී ගුණධර්ම පිරීමෙන් කුමන හෝ පුද්ගලයකුට පොදු වශයෙන් ලැබෙන ආනිසංස 05ක් අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ දුච්චරිත සූත්‍රයෙන් බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබේ.**

ඒ අනුව තමන් තමන්හට උපවාද නොකරයි. නුවණැත්තෝ සීලාදී ගුණදම් රකින ඔහු පසසති. යහපත් වූ කීර්ති රාවයක් උස්ව නැගෙයි. මුළා නොවී මරණයට පත් වෙයි. මරණින් මතු සුගති ලෝකයක උපත ලබයි.

මෙයට අමතරව සීලාදී ගුණදම් රකින්නාට ලැබෙන ආනිසංස 05ක් සහ සීලාදී ගුණදම් නොරකින්නාට ලැබෙන ආදීනව 05ක් අංගුත්තර නිකායේ පඤ්චක නිපාතයේ අක්කෝසක වග්ගයේ දී "සීල සූත්‍රයෙන්" පෙන්වා දී තිබේ. එම ආදීනව නම්

මහණෙනි, සීල විපත්තියට පත් ගිහි දුස්සීලයා ප්‍රමාදය නිසා මහත් භෝග හානියට ද, පැවිදි දුස්සීලයා සප්තාර්ය ධන හානියට ද පැමිණෙයි.

සීල විපත්තියට පත් දුස්සීලයාගේ පව්ටු කීර්තිරාවය දසත පැතිරී යයි.

සීල විපත්තියට පත් දුස්සීලයා ක්ෂත්‍රිය පිරිසකට වේවා, ශ්‍රමණ පිරිසකට වේවා යම් පිරිසක් වෙත එළඹේ නම්, බිය සහිත වූයේ, සැක සහිත වූයේ ම වෙයි. සීල විපත්තියට පත් දුස්සීලයා සිහි මුළා වී කළුරිය කරයි. සීල විපත්තියට පත් දුස්සීලයා මරණින් මතු අපාය වූ, දුගති වූ, විනිපාත වූ නිරයට ම පැමිණෙයි.

යම් පුද්ගලයකු කවර ජාතියකට, ආගමකට, කුලයකට, රටකට අයත් වුව ද සීලාදී ගුණධර්ම දියුණු කරයි ද මෙවන් ආනිසංසයක් ලබයි.

මහණෙනි, සිල් ගුණදම් පුරන සිල්වතා අප්‍රමාදය නිසා මහත් වූ භෝග සම්පත් ලබයි.

සිල් ගුණදම් පුරන්නාට යහපත් කීර්ති රාවයක් ගොඩනැඟෙයි.

සිල් ගුණදම් පුරන්නාට කවරකු අභිමුවට එළඹෙයි ද, විශාරදව නිර්භයව නිසැකව පිවිසිය හැක.

සිල් ගුණදම් පුරන්නා සිහි මුළා නොවී කළුරිය කරයි.

සිල් ගුණදම් පුරන්නා මරණින් මතු සුගති වූ ස්වර්ග ලෝකයකට පැමිණෙයි.

පොදුවේ ගත් විට ඉහත ආනිසංස සීලාදී ගුණධර්ම වර්ධනය කරන ඕනෑම කෙනකුට ලැබේ. මෙහිදී විශේෂයෙන් දැනගත යුත්තක් ද තිබේ. එනම් පංචසීල ප්‍රතිපදාවට අයත් එක් එක් සිල්පද වෙන වෙන ම ගත් කල ඒවාට ද විශේෂ වූ ආනිසංස සමූහයක් ඇති බවයි. එබඳු ආනිසංස 97ක් කවර ජාතියකට, ආගමකට, රටකට, අයත් වූවකුට වුව ද පංචසීල ප්‍රතිපදාවෙහි සංවර වේ නම් ඒකාන්තයෙන් ලබා ගත හැකි බවයි.

සත්ව ඝාතනයෙන් වැළකී සිටීමෙන් ආනිසංස 23ක් ලැබේ. එනම්, ආරෝහ පරිනාහ දේහ සම්පත්තියක් ලැබීම, මනාවූ කායික ජවයකින් යුතුවීම, මනාව පොළොවෙහි පිහිටන පියවර ඇත්තකු වීම, රන්වන් වූ පැහැබර සමකින් යුතුවීම, මෘදු මොළොක් සිරුරක් ලැබීම, නිර්මල වූ පිරිසුදු පැවතුම් ඇත්තකු වීම, සූරවීර ගති ඇත්තකු වීම, මහා බලවන්තයකු වීම, නොපැකිළව කිව හැකි වචන ඇත්තකු වීම, ලෝක සත්වයන්ට ප්‍රිය මනාප වූ පුද්ගලයකු වීම, පහකළ දොස් ඇත්තකු වීම, කෙනකුට කේළාම් කියා බිඳවිය නොහැකි පිරිවර සේනා ලැබීම, තැති නොගත් කෙනකු වීම, විනාශ කළ නොහැකි උතුමකු වීම, පර උපක්‍රම මගින් අකල් මරණයකට පත් නොවීම, සංඛ්‍යාවක් නොදැක්විය හැකි පිරිවර සේනා ලැබීම, සුරූපී පුද්ගලයකු වීම, මනා සටහන් ඇත්තකු වීම, අල්ප ආබාධ ඇත්තකු වීම, ශෝක නොකරන්නකු වීම, ප්‍රියමනාප පුද්ගලයන්ගෙන් ඈත්වන්නට සිදු නොවීම, දීර්ඝායුෂ ලබන්නකු වීම හා මනාව පිහිටි අඟපසඟ ඇත්තකු වීම ය.

සොරකමින් වැළකී සිටීමෙන් ලැබෙන ආනිසංස මෙසේ ය.

මහා ධනවතකු වීම, බොහෝ ධන ධාන්‍ය ලබන්නකු වීම, අප්‍රමාණ ලෙස භෝග සම්පත් ලැබීම, නූපන් වස්තුව උපදවීමට පුණ්‍ය ශක්තිය ඇත්තකුවීම, ලැබී ඇති භෝග සම්පත් රැක ගැනීමට වාසනාව තිබීම, කැමති යම් වස්තුවක් වේ ද, වහා එය ලබන්නකු වීම, රජුට, සොරුන්ට, ගින්නට, ජලයට, අප්‍රිය දරුවන්ට විනාශ කළ නොහැකි වස්තුව ලැබීම, වෙනත් කිසි කෙනකුට නොමැති පරිදි ධන වාසනා ඇත්තකු වීම, ලෝකයේ ම උත්තමයකු බවට පත්වීම, නැත යන වචනය අසන්නට නොලැබීම හා සැප විහරණ ඇත්තකු වීම ය.

බ්‍රහ්ම චර්යාවෙහි වාසය කිරීමෙන් වන ආනිසංස මෙසේ ය

සතුරන් නැත්තකු වීම, සියල්ලන්ට ම ප්‍රිය අයකු වීම, ආහාරපාන, ඇඳුම් පැළඳුම්, ඉඳුම් හිටුම් ලැබීමේ භාග්‍යය ඇත්තකු වීම, සැප සේ නින්ද යාම, සැප සේ පිබිදීම, අපාය බිය නැත්තකු වීම, ලබන ජීවිතය අභව්‍ය තත්වයන්ට පත් නොවීම, ක්‍රෝධය අඩු පුද්ගලයකු වීම, සුපරික්ෂාකාරී අයකු වීම, කර නොබාගත් පුද්ගලයකු නොවීම, සැක බය නිසා බිම බලා සිටින කෙනකු නොවීම, ඔවුනොවුන්ට ප්‍රිය මනාප අඹු සැමියන් ලැබීම, සම්පූර්ණ ඉඳුරන් ලැබීම, පිරිපුන් දේහයක් ලැබීම, සැක නැති අයකු වීම, මහන්සි නොවී ධනය ලබන්නකු වීම, සැප විහරණ ඇත්තකු වීම, කුමක් නිසාවත් කිසි තැනක බිය නොවන්නකු වීම හා ප්‍රියයන්ගෙන් වෙන් නොවන්නකු වීම ය.

**සීල විපත්තියට පත් දුස්සීලයා ක්ෂත්‍රිය පිරිසකට වේවා, ශ්‍රමණ පිරිසකට වේවා යම් පිරිසක් වෙත එළඹේ නම්, බිය සහිත වූයේ, සැක සහිත වූයේ ම වෙයි. සීල විපත්තියට පත් දුස්සීලයා සිහි මුළා වී කළුරිය කරයි. සීල විපත්තියට පත් දුස්සීලයා මරණින් මතු අපාය වූ, දුගති වූ, විනිපාත වූ නිරයට ම පැමිණෙයි.**

බොරු නොකීමේ අනුසස් මෙසේ ය.

අතිශයින් ප්‍රසන්න ඉඳුරන් ලැබීම, මිහිරි කටහඬක් ලැබීම, සමානව පිහිටි සුදුවන් දත් දෙපළක් ලැබීම, අශෝභන වූ මහත් ශරීරයක් නොලැබීම, අශෝභන වූ කෙට්ටු ශරීරයක් නොලැබීම, අශෝභන වූ මිටි ශරීරයයක් නොලැබීම, අශෝභන වූ උස ශරීරයක් නොලැබීම, සැප ස්පර්ශ ලබන්නකු වීම, මහනෙල් මල් සුවඳ ඇති මුඛයක් ලැබීම, සුවච කීකරු පිරිවර ජනයා ලැබීම, විශ්වාස කළ යුතු වචන ඇති අයකු වීම, මෘදු වූ රත්පැහැ ඇති දිවක් ලැබීම, උඩඟු නොවන්නකු වීම හා චපල වචන, වැඩ ක්‍රියා නැත්තකු වීම ය.

මත්වතුර, මත්ද්‍රව්‍ය පානය නොකිරීමෙන් ලැබෙන අනුසස් මෙසේ ය.

තුන්කල්හි කරන යම් කටයුත්තක් වේ ද, එය වහා වැටහෙයි, සෑම විට එළඹ සිටි සිහිය ඇත්තකු වීම, උම්මත්තක නොවීම, ඥාණවන්තයකු වීම, අලස නොවීම, නොහික්මුණු ක්‍රියා නොකිරීම, කෙළතොලු නොවීම, තරුණ මදයෙන් මත් නොවීම, අප්‍රමාද විහරණ ඇත්තකු වීම, මෝහයෙන් මුළා නොවීම, තැති ගැනීම් නැත්තකු වීම, එකට එක නොකිරීම, ඊර්ෂ්‍යා නොකරන්නකු වීම, සත්‍ය වචන කතා කරන්නකු වීම, කේළාම්, පරුෂ, හිස්වචන කතා නොකරන්නකු වීම, දිවා රාත්‍රී අනලස්ව කටයුතු කිරීම, කළගුණ දන්නකු වීම, ප්‍රතිඋපකාර කරන්නකු වීම, මසුරුබව නැත්තකු වීම, ත්‍යාගවන්තයකු වීම, මහා සීලවන්තයකු වීම, සෘජුගති ඇතිවීම, ක්‍රෝධ නැති සත්පුරුෂයකු වීම, පව් කිරීමට ලජ්ජා ඇති ගුණවතකු වීම, පව් කිරීමට බිය ඇත්තකු වීම, සෘජු අදහස් ඇති පණ්ඩිතයකු වීම, මහා ප්‍රඥාවන්තයෙක් වීම, මහා චිත්ත ශක්තියක් ඇත්තකු වීම, දාර්ශනික අදහස් ඇති පණ්ඩිතයකු වීම හා අර්ථය, අනර්ථය වැටහෙන බුද්ධිමතකු වීම ය.

සීලයෙන් කෙරෙනුයේ හැදියාව ඇති අයකු සකස් කිරීමයි. හැදියාවෙන් පූර්ණ සමාජය සැක, බිය, සංකා, නැති පරිසරයකි. එබඳු පරිසරයක ජීවත්වන්නට ලෝකයේ සියලු සත්වයන් කැමති ය.

එසේ නම් සීලය මානවයාට ම අයත් ධර්මයක් නොවන්නේ ද?

දඩල්ල, වාලුකාරාමයේ අනුශාසක,
ශාස්ත්‍රපති
**රත්ගම සුනීත හිමි**



# ආත්ම විශ්වාසය හීන දීන බව පරාජය කරයි

අතිපූජ්‍ය අත්තුඩාවේ සිරි රාහුල මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ






**බෞද්ධ ධර්මය මිනිසා ගේ ජීවිතය ක්‍රමවත් ව උසස් තත්ත්වයකට නංවන මාර්ගය පෙන්වන්නකි. එසේ දැක්වීමේ දී වුව ද උන්වහන්සේ පුද්ගලයා ගේ නිදහසට ගරු කළ සේක. උන්වහන්සේගේ දේශනයෙහි කවර තැනකවත් විධානයක් දක්නට නැත.**

**තුම්හෙහි කිච්චං ආතප්පං**
**අක්ඛාතාරො තථාගතා**

නුඹලා විසින් ක්‍රියා කළ යුතු ය. තථාගතයන් වහන්සේ මාර්ග දේශකයෙක් පමණි.

එදා දඹදිව උන්වහන්සේගේ කීර්ති ඝෝෂාව මගධ – කාසි – කෝසල ආදී ජනපදයන් ඔස්සේ පැතිරී ගියේ ය. ශ්‍රේණිය – බිම්බිසාර, ප්‍රසේනජිත් කොශල වැනි මහ රජවරුන්, උපාලි – උග්ග වැනි සිටුවරුනුත් ප්‍රමුඛ කොට නොයෙක් තරාතිරම්වල අය උන්වහන්සේ සමඟ සාකච්ඡා කිරීමට, දහම් ඇසීමට පැමිණියාහු වෙති. ඔවුන්ගේ හැඟීම් බලයෙන් තමා කෙරෙහි නතු කර ගැනීමට උන්වහන්සේ කැමති නොවූ හ.

උපාලි සිටුතුමා උන්වහන්සේ කෙරෙහි පැහැද එය ප්‍රකාශ කරන විටත් ප්‍රකාශ කළේ ඔබ වැනි අය යම් යම් නිගමනවලට බසින විට සිතා බලා ම එසේ කළ යුතු ය යන්න යි. එයින් පුද්ගලයා ගේ නිදාසත්වය මෙන් ම බුද්ධි ගරුකත්වය ද කෙරෙහි සැලකිල්ලක් දැක්වූ බව පෙනේ.

බුද්ධ ධර්මය හේතුඵල වාදයකි. එහෙයින් බුද්ධ ධර්මය ලෝකයේ පවත්නා තාක් සියල්ල හේතු ප්‍රත්‍යයෙන් ඇති වේ යැයි දක්වයි. හේතුව නිසා ඵලයත්, ඵලය නිසා හේතුවක් ඇති විය හැකි අතර, මේ හේතු ප්‍රත්‍යයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව නිසා ලෝකයේ පැවැත්මත්, වෙනස්වීමත්, වර්ධනයත් වන බැව් දක්වයි. හේතු ප්‍රත්‍යයන්ගේ අභාවයෙන් ඔවුන්ගේ විනාශය දක්වයි.

**හේතු පටිච්ච සම්භූතං**
**හේතු භංගා නිරුජ්ඣති**

යනුවෙන් බුදුන් වහන්සේ එය ඉගැන්වූහ. හේතූන් නිසා ඇති වන යම් යම් දේ ඒවායේ වෙනස්වීමෙන් අභාවයට පත්වෙයි.

බුදුදහම උගන්වන මේ හේතුඵලවාදය නූතන විද්‍යාත්මක ලෝකයේ විශාල විප්ලවයක් කොට ඇත. ඉතිහාසය, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විෂයයන් අද විග්‍රහ කරනු ලබන්නේ මේ හේතුප්‍රත්‍යයන් මත පිහිටා ය.

එදා ස්වභාවික සිද්ධීන් හරි හැටි තේරුම් නොගත් මිනිසා දේව රහස් සේ, දෙවියන්ගේ කැමැත්ත පරිදි සිදුවන දේ මෙන් සලකා සර්ව බලධාරී දෙවියන් වහන්සේ වෙත පැවරූ යම් යම් සිද්ධාන්තයන් අද විද්‍යාත්මක නිගමනයනට පින් සිදු වන්නට, හේතු ඵලයන්ගේ සමවාය ය නිසා සිදු වන බැව් වටහා ගෙන ඇත. මෙසේ ලෝකයේ පවත්නා සියලුම ධර්මතාවන්ට තුඩු දුන් මූලික හේතුවක් හැටියට හේතුඵල වාදය හැඳින්විය හැකි ය. ලෝකයෙහි පවත්නා විවිධත්වය – විෂමත්වය ආදි සියල්ලට ම හේතුව මේ ය.

බුද්ධ ධර්මය සාංදෘෂ්ටික ය. අකාලික ය. එහෙයින් එයින් ලබන ප්‍රයෝජනය මතු සසරට සීමා කරන්නෙක් නොවේ. මේ ලොව දී ම තමන්ගේ අඩුපාඩු සකස් කර ගෙන ඒවායේ ප්‍රතිඵල ප්‍රත්‍යක්ෂයෙන් ම දත හැකි වීම වැදගත් ම දෙයකි.

මිනිසා බලාපොරොත්තු වන සියලු යහපත ඔහුගේ උත්සාහයෙන් ම ඔහුට ලැබිය හැකි ය. ‘අත්ත දීපා විහරථ’ තමාගේ විමුක්තිය පාදා ගැනීමේ සම්පූර්ණ වගකීම ඔහු සතු ය. එහෙයින් මනුෂ්‍යයා පිළිබඳ සම්පූර්ණ ස්වාධීනත්වය ම බුද්ධ ධර්මයෙන් පිළිගැනී ඇත. එහෙයින් ඔහු නිවහල් පුද්ගලයකු බවට පත් කිරීමේ පරම වාසනාව ද ඉන් ඔහුට ලැබී ඇත.

බෞද්ධ ධර්මය පරලොව සැපතට සීමා වූවක් නොවේ.

එහෙයින් මෙලොව ජීවිතය සකස් කර ගැනමට අවශ්‍ය සැප

අත්ථි සුඛ, භෝග සුඛ, අනණ සුඛ හා අනවජ්ජ සුඛ වශයෙන් දක්වා ඇත. ස්ථිර අධිෂ්ඨානයත් – අප්‍රතිහත ධෛර්යයත් යන දෙකින් යුක්ත වූ කවර පුද්ගලයකුට වුව ද දියුණු වීමට මාර්ගයක් වශයෙන් එය දක්වා ඇත්තේ ය. මේ අනුව බුදු දහමේ ඉතා වැදගත් වූ ජීවිත දර්ශනයක් ද ගැබ් ව ඇත. අනුන් ගේ, නොපෙනෙන, නො දක්නා බලවේගයනට නතු නොවී තමාගේ ම උත්සාහයෙන්, තමාගේ ම වටපිටාව තමනට අවශ්‍ය සේ සකසා ගැනීමේ මාර්ගය ඔහුට විවෘතව ඇත.

ලෝකය වාසනාවන්ත වූවක් හෝ අවාසනාවන්ත වූවක් කිරීමේ සම්පූර්ණ වගකීම ඔහු සතු ය.

බුදුදහමේ දැක්වෙන මානුෂික ධර්මත්, ආත්ම ශක්තියත්, නිවැරැදි විසඳුමත් යන කරුණු ඔස්සේ මිනිසාගේ ස්වාමිත්වය ඔහු කෙරෙහි පවරා ඇත. නො පෙනෙන බලවේගයන් කෙරෙහි ගැතිවීමෙන් ආත්ම හීන භාවයට මිනිසා පත් වන බව පෙනේ.

ආගමික අදහස් පිළිබඳ ප්‍රාථමික යුගයෙහි මිනිසා තමාට නොපෙනෙන අද්භූත බලවේගයන් කෙරෙහි විශ්වාසය තැබී ය. එය ක්‍රමයෙන් දියුණුවත් ම දේව විශ්වාසයක් බවට පත්විය. මිනිසා ගේ බුද්ධිය මුහුකුරායත් ම විද්‍යාත්මක පර්යේෂණයන්ගේ සත්‍යය එළිදරවුවත් ම දේව විශ්වාසයන් දෙදරා යන්නට විය.

බුදුන් වහන්සේ දේවත්වයට වඩා උසස් කොට, අගය කොට මනුෂ්‍යත්වය සැලකූහ. ලොව ඇති ශ්‍රේෂ්ඨම තත්ත්වය වූ බුද්ධත්වයට පත් විය යුත්තේ දෙවියෙක් නො වේ. බ්‍රහ්මයෙක් නොවේ. මනුෂ්‍යයෙකි. මනුෂ්‍යයකු ඒ අනුත්තර ශ්‍රේෂ්ඨත්වයට පත් වූ පසු එතුමාට සේවාව කිරීමට ඔවුහු පැමිණෙති.

එපමණක් ද නොවේ. සිල්වත්, ගුණගරුක ගිහියාට ද වඩා දෙවියා පහත් ය. දෙදෙව් ලොවට ම අධිපති ශක්‍රයා පවා ධාර්මික, අඹුදරුවන් පෝෂණය කරන, සිල්වත් ගිහි උපාසකයනට වඳින බව,

**‘යෙ ගහට්ඨා පුඤ්ඤකරා**
**සීලවන්තා උපාසකා**
**ධම්මේන දාරං පොසෙන්ති**
**තං නමස්සාමි මාතලී’**

යන දේශනයෙන් පැහැදිලි වෙයි.

සියලු සත්ව ප්‍රජාව ගේ ම උසස් තැන මිනිසාට හිමි වී ඇත. ඒ මිනිසුන් අතර පරමාර්ථී මනුෂ්‍යයෙක් වෙයි.

බ්‍රාහ්මණයෝ බ්‍රහ්මන් ලෝකයේ මැවුම්කාරයා කොට සැලකූහ. එහෙයින් සෑම දෙයක් කෙරෙහි ම බ්‍රහ්මගේ ඒකාධිකාරී ස්වභාවය පැතිරී ඇතැයි සිතූ හ. එහෙත් බෞද්ධ දර්ශනයේ එන අනාත්ම වාදයත්, ප්‍රතීත්‍ය සමුත්පාද ධර්මයත් දෙක නිසා, ඊට පහර වැදිණ. බ්‍රහ්ම – ඊශ්වර දේ ව වාද එයින් දෙදරා ගියේ ය. දෙවියන්ගේ තත්ත්වය, සාමාන්‍ය තත්ත්වයකට වැටිණ. මුල දී දෙවියන්ගේ සේවකයකුවූ මිනිසා, පසු

> “බුද්ධ ධර්මය හේතුඵල වාදයකි. එහෙයින් බුද්ධ ධර්මය ලෝකයේ පවත්නා තාක් සියල්ල හේතු ප්‍රත්‍යයෙන් ඇති වේ යැයි දක්වයි. හේතුව නිසා ඵලයත්, ඵලය නිසා හේතුවක් ඇති විය හැකි අතර, මේ හේතු ප්‍රත්‍යයන්ගේ අන්‍යෝන්‍ය සම්බන්ධතාව නිසා ලෝකයේ පැවැත්මත්, වෙනස්වීමත්, වර්ධනයත් වන බැව් දක්වයි. හේතු ප්‍රත්‍යයන්ගේ අභාවයෙන් ඔවුන්ගේ විනාශය දක්වයි.”

යුගයේ දී දෙවියන්ගෙන් වැඳුම් පිදුම් ලබන්නෙක් විය.

බෞද්ධ සාහිත්‍යයට අනුව සහම්පති, ඝටීකාර, නාරද, බක වැනි බ්‍රහ්මයෝ බුදුන් වහන්සේට සේවාව කිරීමට පැමිණියෝ වූහ. මජ්ඣිම නිකායේ බ්‍රහ්ම නිමන්ත්‍රණ සූත්‍රයෙහි බක බ්‍රහ්මයා ගේ බලය බිඳ දමා ඇති අයුරු දැක්ක හැකිය. කේවට්ට සූත්‍රයේ දී බ්‍රහ්මයා උපහාසයට ලක් කොට ඇත. මින් පෙර බ්‍රාහ්මණයනට, දෙවියනට, තුබූ තත්ත්වය බුදු දහමේ උදාවත් සමඟ මිනිසා කෙරෙහි පැවරුණේ විය.

විවිධත්වයෙන් හා සංකීර්ණත්වයෙන් පිරුණු ජීවිතයකට ආත්ම විශ්වාසය අවශ්‍යය. ආත්ම විශ්වාසයෙන් තොර වූ විට මිනිහා බැගෑ බවට පත් වෙයි. බැගෑ බව මානසික ව්‍යාධියෙකි. මේ යටත් භාවයෙන් මිදී නිදහස් වන්නට මිනිසාට මඟ පෑදුනේ තමාගේ දෙවියා තමා ම යැයි වැටහුණ දා සිට ය. ඒ බුද්ධ ධර්මයේ ආශිර්වාදයේ ප්‍රතිඵලයකි.

බුදුසරණ
35, ඩී. ආර්. විජයවර්ධන මාවත, ලේක්හවුස් - කොළඹ.
ටැලිෆෝන් - 2429598, 2429429 ෆැක්ස් - 2429329, 2449069

ඉල් අව අටවක 2022-11-16

## ආකල්පමය වෙනසක් ඕනෑ

දියුණුව මිස පරිහානියට යන්නට කිසිවෙක් අකැමැති ය. ඒ අභිලාෂයට ළං වෙන්නට වෙර දරන අය අතර හොඳින් මෙන් ම නරකින් ද කටයුතු කරන්නෝ වෙති. පව පින හඳුනන, කර්මය, කර්ම පලය විශ්වාස කරන්නෝ යහපත් මාර්ගයෙන් ම ඒ තැනට ළං වෙති. ඔවුහු සැබෑ දියුණුව අත්පත් කරගන්නෝ වෙති. ඒ අතර තවත් පිරිසකි. ඔවුහු අනුන්ට කුමක් වුව ද තමන්ගේ අරමුණ ඉටුවනවා නම් යනුවෙන් සිතන්නෝ ය. ඔවුන්ට හොඳ නරක අවැසි නැත. ආධ්‍යාත්මයට වැට බැඳ භෞතික දියුණුව පමණක් අපේක්ෂා කරන ඔවුහු ඒ අරමුණ තුළ පමණක් නොව මේ සසර ද අතර මං වෙති. ඒ ඔවුන් අපේක්ෂා කරන දියුණුව තුළ ම විනාශය සැඟවී ඇති බැවිනි.

සමාජය උඩුයටිකුරු වන්නේ ද මෙවැන්නෝ නිසා ය. සමාජ වටිනාකම් ගිලිහී නොවටිනාකම් මතු වන්නේ ඔවුහු සුලභ නිසා ය. එහෙයින් ආකල්පමය වෙනසකින් චර්යාමය වෙනසකට ගමන් කළ යුතු කාලය දැන් එළඹ ඇත. අස්වයා ගියාට පසු ඉස්තාලය වසා ප්‍රයෝජනයක් නැති සේ, සමාජ පරිහානියේ සීමාව ඉක්මවා ගියේ නම් සිදුවන්නේ පසුතැවිලි වන්නට ය. එය සියලු දෙනා එක්වී විඳින්නට වන අභාග්‍යයකි. එහෙයින් කුඩා දරුවාගේ සිට වැඩිහිටියා දක්වා ම ආගමානුකූලව හැඩගැසීමට වෙර වීරිය දැරිය යුතු ව ඇත.

ජාතකකතා පොත් වහන්සේ තුළ අන්තර්ගත අත්ථස්සද්වාර ජාතක කතාව දියුණුව කැමැති බෞද්ධයාට මහඟු මිණකි. එහි දරුවෙක් තම පියාගෙන් දියුණුවට හේතුවන කරුණු විමසයි.

ඒ දරුවා ගේ දැක්ම, සමස්ත ළමා පරපුරට ම ආදර්ශයකි. ඒ පැනය බුදුරජාණන් වහන්සේ වෙත ඉදිරිපත් කිරීමෙන් පසු ජීවිතයේ අභිවෘද්ධියට හේතුවන කරුණු සයක් පිළිබඳ උන්වහන්සේ දේශනා කොට වදාළහ. ඒ කරුණු සය ජීවිතයේ බාල, තරුණ, මහලු යන කවර අවස්ථාවකට වුව ද උචිත ය. විපුල පල දෙන්නේ ය.

ඒ කරුණු අතර නීරෝගී බව ප්‍රධාන ය. ඕනෑම කාර්යයක් සපල කර ගත හැකි නිරෝගී නම් ය. කය, මනස රෝගී වූ විට දැනෙන වෙහෙසකාරී බව හා පීඩාකාරී බව බොහෝ අතපසුවීම් ඇති කරයි. යමක් නිවැරැදිව තීරණය කරන්නට, ක්‍රියාවේ යෙදවීමට බාධා ගෙන දෙයි.

අපේ සමාජයේ බොහෝ දෙනා රෝගී වන්නේ තමන්ගේ ම වරදිනි. බොහෝ විට කට පරිස්සම් කර ගැනීමට නොහැකි වීම නිසා ය. ආහාරයේ පමණ නොදැනීම, නිවැරැදි ව්‍යායාම නොමැතිකම, වැරැදි ආහාර රටාව හා පැවැත්ම අද බොහෝ දෙනෙක් දියවැඩියාව වැනි බෝ නොවන රෝගවලට ඇද දමා තිබේ.

රෝගී බව ජීවිතයේ ක්‍රියාකාරකම් පහළට ඇද දමනවා සේ ම ආර්ථිකව ද වෙසෙස් බලපෑම් ඇති කරයි. එය තම තමන් විමසීමෙන් ම අවබෝධ කරගත හැකි ය. එහෙයින් මනා සෞඛ්‍ය පුරුදු ගැන ආකල්පය කුඩා කල සිටම පුරුදු පුහුණු කොට කායික, මානසික නිරෝගී බව රැක ගන්නට වෙහෙසිය යුතු ය. අප ලබන පරම ලාභය එය වන බැවිනි.

දියුණුව ලද හැකි තවත් වැදගත් කරුණක් වන්නේ සීලයයි. හැදියාව, සංවරකම නැති තැන ය බොහෝ දේ විපරීත ලෙස විසඳෙන්නේ. අසංවර, නොහික්මුණු තැනැත්තාට තමන් ගැන හෝ අනුන් ගැන වගවිභාගයක් නැත. එහෙයින් චර්යාමය වෙනසක් ගැන වහ වහා පිළියම් යෙදිය යුතුව ඇත්තේ ඒ සඳහා නිවැරැදි මඟ සක් සුදක් සේ පැහැදිලි වුව ද ඒ මඟ යන්නට බොහෝ දෙනෙක් මැළි වන නිසා ය. පංච සීලය මිනිසා හික්මවන ප්‍රතිපදාවකි. එය කුඩා කල සිට ම කටට හුරු කළ ද කයට, මනසට ගෝචර නොකිරීම නිසා බොහෝ දෙනා වචනයට පමණක් සීමා කරනු පෙනේ. ආකල්පමය වෙනසක් වහ වහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ යුතු යැයි කියන්නේ එහෙයිනි.

# අවශ්‍යතා අඩු තරමට ජීවිතය සැහැල්ලුයි



මහනුවර අස්ගිරි මහා විහාරයේ කාරක සංඝසභික හා උපාධ්‍යාය ධුරන්ධර වයඹ පළාතේ ප්‍රධාන සංඝනායක මහාචාර්ය
**තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ නාහිමි**

**අපේ සමාජයේ ළමුන් පමණක් නොව ඇතැම් වැඩිහිටි උදවිය, රෝගීන්, විශේෂයෙන් කාන්තා පක්ෂය සුභර තත්ත්වයෙන් ඈත්ව සිටිනා ආකාරයක් දක්නට පුළුවනි.**

**පවුලේ උදවිය විසින් බොහොම අපහසුතා මැද හරිහම්බ කර මේ කියන අය පෝෂණය කරනවා. ඉතින් ඒ අයගේ උපරිම ශක්තියෙන් එහෙම පෝෂණය කළත් ඒවායෙහි අඩුපාඩු ද ඇති වනවා.**

***මෙම ලිපියේ මුල් කොටස ඉල්පුර පෝද (07) පත්‍රයේ පළවිය.***

එවැනි අවස්ථාවල වැඩිහිටියන්, රෝගීන්, කාන්තාවන්, භාර්යාවන් ඒවායින් සෑහිමකට පත් නො වී බොහොම අපහසුතා මැද තමන්ගේ අවශ්‍යතා ඉටු කරන දරුවන්, උපස්ථායකයන්, ස්වාමි පුරුෂයන් වැනි අයට සැරවැර කරමින්. තමන්ට දුක සේ ලබා දෙන දේ ප්‍රතික්ෂේප කරමින්, ඉවත දමමින් ක්‍රියා කරනවා දක්නට පුළුවන්.

ඇතැම් අවස්ථාවල හිඟමන් ඉල්ලා ගෙයින් ගෙට යන යාචකයන් පවා තමන් අපේක්ෂා කරන ආකාරයෙන් යමක් නො ලැබෙන විට නින්දා අපහාස කරමින් ක්‍රියා කරන ආකාරය ඔබ අප කවුරුත් අත්දැක තිබෙන සුලභ කරුණක් නොවේ ද?

විශේෂයෙන් ම කරණීයමෙත්ත සූත්‍රය බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර තිබෙන්නේ භික්ෂූන් වහන්සේ අරමුණ කර ගෙනයි. උන්වහන්සේ සුභර තත්වයෙන් තම ජීවිත පවත්වා ගෙන යාමේ අගය මෙහි දී වටහා ගත යුතු ව ඇත.

චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලානප්‍රත්‍යය යයි කියන මේ සිව්පස පරිභෝගයේ දී උන්වහන්සේ සුභර තත්වයෙන් වාසය කළ යුතු බව නොයෙක් අවස්ථාවල දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙනවා.

එපමණක් නොව විනය පිටකයේ නොයෙක් තැන්වල උන්වහන්සේ විසින් මේ කරුණ සම්බන්ධයෙන් විවිධ අවස්ථාවල පැනනැඟුණු අසතුටුදායක භික්ෂු පැවැතුම් හේතුකර ගෙන විනය නීති රැසක් ම පනවා ඇති ආකාරය මෙහි දී අප විසින් පැහැදිලිව තේරුම් ගැනීම වැදගත් වෙනවා,

එහි දී උන්වහන්සේ කොපමණ සැහැල්ලුවෙන්, සුභර තත්වයෙන් වාසය කළ යුතු ද යන්න පැහැදිලි කරන අවස්ථාවක් ලෙස චූල්ලහත්ථිපදොපම සූත්‍රයේ එක අවස්ථාවක ජානුස්සෝණි නම් බමුණා අමතා බුදුරජාණන් වහන්සේ භික්ෂුවගේ සුභර බව මෙසේ ප්‍රකාශ කර තිබෙනවා.

ඒ අනුව මේ ශාසනයෙහි උතුම් පැවිදි බව ලබන භික්ෂුව තමන්ගේ කයට සෑහෙන චීවරයකිනුත්, කුසට ප්‍රමාණවත් වන පිණ්ඩපාත ආහාරයෙනුත් තෘප්තියට පත් වෙනවා.

මේ කියන භික්ෂුව යම් තැනකට වැඩමවනවා නම් පාත්‍රය හා සිවුර පමණක් ම ඒ යනකොට අරගෙන යනවා. එම කරුණ බුදුරජාණන් වහන්සේ තවදුරටත් පැහැදිලි කරනවා. යම් ආකාරයකට ළිහිණි කුරුල්ලෙක් කොහේ හෝ දිශාවක් බලා පියාඹා ගෙන යනවා නම් ඒ කුරුල්ලාට දැනෙන එකම බර වන්නේ තම පියාපත් බර පමණයි. අන්න ඒ වගේම තමා භික්ෂුවට ඇති එකම බර පාත්‍රය හා කය පරිහරණයට යොදා ගන්නා චීවරය පමණ යි.

මේ නිසා සසර කතරින් එතෙර වීමේ අරමුණෙන් පැවිදි බව ලබන භික්ෂුව සිතේ ඇති වන සැහැල්ලු බව නිසා ම අනවජ්ජ සුවය නිරන්තරයෙන් ම අත්විඳින බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා.

මේ ආකාරයෙන් භික්ෂූන් වහන්සේ තමන්ට ලැබෙන අතිරේක ලාභ ප්‍රයෝජනයෙන් පමණක් සෑහිමකට පත් වී මහත් අපේක්ෂා ඇතිව වාසය කළොත් හැම විටම සිතට සුවයක් දැනෙන්නේ නැහැ. මේ නිසාම අනවජ්ජ සුඛයෙන් භික්ෂුව ඈත් වී දුභර භික්ෂු ජීවිතයක් පවත්වා ගෙන යාමට සමත් වෙනවා.

**යම් ආකාරයකට ලිහිණි කුරුල්ලෙක් කොහේ හෝ දිශාවක් බලා පියාඹා ගෙන යනවා නම් ඒ කුරුල්ලාට දැනෙන එකම බර වන්නේ තම පියාපත් බර පමණයි. අන්න ඒ වගේම තමා භික්ෂුවට ඇති එකම බර පාත්‍රය හා කය පරිහරණයට යොදා ගන්නා චීවරය පමණ යි.**

# වාසනාවන්ත ම මවුපියන් වෙන්න ඔබත් කැමැති ද?



උඩුම්මිට උත්තමාරාම
පුරාණ විහාරයේ
**මොරටුවේ ආනන්ද හිමි**





**අරුත් සුන් වදන් කිය කිය රන් සදිසි කාලය අපතේ නොයවා කාලයෙන් වැඩගෙන පොත පත කියවා දැනුම් ගවේෂණයේ නිමග්නවීමට ද, විවේකය ඵලදායිව ගෙවීමට ද කුඩා කල පටන් ම අපේ පොඩි ඇත්තෝ හුරුපුරුදු කළ යුතු ය**

**"පාට සුවඳ එක වගේ,**
**තිබෙන රෝස මල වගේ**
**කීකරු හොඳ දරුවගේ**
**කවුරුත් පවසති අගේ"**

මෙබඳු හැදුණු හොඳ දරුවා කුරා කූඹියකුගේවත් පණ නොනසයි. කෙනෙකු සන්තක අන්සතු අල්පෙනෙත්තක දෙයක් නොඉල්ලා නොගනියි. වචනයෙන් වන වැරැදිවලින් වැළකෙයි.

**"මහනෙල් සුවඳ ම ය**
**කුඩමසු පිළී ගඳ ම ය**
**දෙකට එක දිය ම ය**
**හොඳට නරකට දෙකට කට ම ය"**

යැයි දැන වචනයෙන් වැරැදි නොකරයි.

අපේ බුදුපියාණන් වහන්සේ පෙරුම්පුරන සමයේදිත් කිසිදා කිසිවිට අසත්‍යයක් නොබිනු සේක. සත්‍යම තෙපළ සේක. ඒ සත්‍යානුභාවයෙන් අදටත් සත්වග සත්සිතට ගෙනෙනුයේ අමිල ශාන්තියකි.

"බොරුකීම කැත ම ය
ගැරඬි කුණටත් නොසෙ ම ය
ඇත්ත නම් කදිමය
මෙලොව රජ සැපතටත් නොසෙ ම ය."

යන උතුම් සිතිවිල්ල සිත්හි දරා අපේ දරුවෝ මොනවට හැඩගැසෙති. එකිනෙකා අතර ගැටුම් ආරවුල්, අසමඟිකම් ඇතිකරන කේළමින් වැළකී සැමගේ සතුටට සමඟියට හොඳ දරුවෝ මඟ පාදති. අනෙකාගේ හදවත නසන රිදවන රළු පරළු බස් නොකියා ප්‍රේමණීය, හෘදයාංගම, කරුණාබරිත මද මුදු අව්‍යාජ පියතෙපුළෙන් හොඳ දරුවා කාටත් සංග්‍රහ කරයි. පරුෂ වචනයෙන් සපුරා බැහැර වෙයි. සුභාෂිතයට තිරිසන් සතා ද නැමෙන බැව් නන්දිවිසාල ජාතක කථාව කියාපායි.

අරුත් සුන් වදන් කිය කිය රන් සදිසි කාලය අපතේ නොයවා කාලයෙන් වැඩගෙන පොත පත කියවා දැනුම් ගවේෂණයේ නිමග්නවීමට ද, විවේකය ඵලදායිව ගෙවීමට ද කුඩා කල පටන් ම අපේ පොඩි ඇත්තෝ හුරුපුරුදු විය යුත්තෝ ය.

දානය, බෙදාහදාගැනීම අරපරෙස්සම, පරාර්ථ චර්යාව, තමාගේ කුසගින්න සේ අනෙකාගේ 'කුසගින්දර ගැන ද සිතීම ආදි සද්ධර්මතා අපේ දරු සන්තාන තුළ පැළ පැදියම් කර ගත යුතු ය. වෙරළු ගෙඩිය හත්කඩකට බෙදාගෙන එදා අපේ අය වෙරළු ගෙඩියේ රස බැලූහ.

**"මේ ගසේ බොහෝ පැණි දොඩම් තිබෙයි**
**වැඩිය කඩන නරක ළමයි එහෙම**
**නොවෙයි අපි –**
**මල්ලිටයි මටයි ගෙඩි දෙකක් ඇතියි"**

අනෙකා ගැන සිතීම, පරාර්ථ චර්යාව, අරපරෙස්සම, සහෝදර බැඳියාව මේ සියල්ල මේ අප පෙර පාසලේ කිවි කවි සින්දු තුළින් මොනවට ඉස්මතු වෙයි.

සතුන් මැරීමෙන්, ප්‍රාණඝාත අකුසලයෙන් පමණක් නොව කරුණා දයා හදින් සතාසීපාවා ගැන සිතීම ද සරු පාදක අත්‍යාවශ්‍ය අංගයකි.

**"පින් සිදුවන්නේ අනේ බාල ළමුන්නේ**
**මගේ කුඩා නිවස කඩා බිම නොදමන්නේ"**

යන කුරුලු ආයාචනය ළමා හදමඬල කරුණාවෙන් බර කරයි. දයාවෙන් පුරවාලයි.

කුරුල්ලාගේ කැදැල්ල පිණිස වූ වෑයම, වෙරවීරිය ද, බිත්තර දැමීම සඳහා වූ පෙර සූදානම ද ළමා හදවතට අගනා පාඩම් ය.

හිරු සඳු සදිසිව අපේ ලෝකය එළිය කරන්නෝ අපේ මව්පියෝ ය. අපේ දිවි රැක පෝෂණය කොට ලොව එළිය දක්වන්නෝ මව්පියෝ ය. ඒ බැව් හොඳින් දැන හොඳ දරුවෝ සැමදා දෙමවුපිය පා කමල් වැඳ අවසර ගෙන පාසලට හෝ වෙනයම් කටයුත්තකට නිවෙසින් නික්මෙති.

කිසිවිටෙක අම්මට තාත්තට පිටුපා, ඔවුන්ගේ වදනට අකීකරුව කටයුතු නොකරති. මව්පිය ආශිර්වාදය තම දියුණුවේ අඩිතාලම බැව් නුවණැති දරුවෝ නිතර සිහිකරති. කොපමණ දුක් ගැහැට ලැබුණත් ඒ සියල්ල මැදහත්ව ඉවසා ඉගෙනුම්කරන සමයේ ඊට ම ජේවී ආදරයෙන් අකුරු කරන්නට දරුවකු කැපවිය යුතු ය.

අල්ලට සිඟා හෝ රස නැති කැවිලි කකා කුසගිනි නිවාගෙන, දැලිකුණු රෙදිවැරලි ඇඳ දහසක් බාධා මැද ඉගෙන කියා ගත් දරුවාට අනාගත යස ඉසුරු මං පෑදෙයි.

අපේ දරුවෝ ඉගෙන කියා ගන්නා සමයේ අනෙකුත් බාහිර බාධා මැඩ ඉදිරි වැඩ තකා ඇල්මෙන් අකුරු ඉගෙනීම මැනවි.

එදා අපේ දරුවෝ සිප්කිරි පොවන ගුරුමෑණියන්ට, ගුරුපියවරුනට කෘතවේදීව සැලකූහ. එලෙසින්ම එදා ගුරුවරු සිප්කිරි, සමඟින් ම ඔවුනගේ ඇවැතුම් පැවැතුම් ක්‍රම ශිල්ප තුළින් හැදියාවේ, ශික්ෂණයේ එන්නත ද දරුවාට ලබා දුන්හ.

**"ගුරු සිත නොරිදවා**
**වේලාව නොවරදවා**
**බැති පෙම් උපදවා**
**අකුරු උගනිව් කුමරු සොඳවා"**

කුඩා කල පටන්ම වේලාවට වැඩ කිරීමේ කලාව බොහෝම සුමටම, සුන්දරව එදා ගුරුවරු දරුවාට ඉගැන්වූහ. එනිසාම කුකුළාට පෙර අවදිව යුහුසුළුව වැඩ කිරීමට හෙළබිම හෙළයෝ හුරුපුරුදු වූහ. එනිසාම දරුවන්ගේ මුවින් නික්මුණේ මෙබඳු කවිය.

**වේවැල් කෝටු නාරං සියඹලා අතු**
**කිතුල් පොල් ඉරටු වැල්කසඹිලිය අතු**
**මේ හැම ඉපල් මගෙ දෑසට නොපෑයුතු**
**පමා නොවී එම අකුරට මෙයින් මතු**

මේ කිසිවක් ළමා හිංසනයන්, ළමා අපරාධයන් නොව ඖෂධීය ඉපල්වලින් ළමා පෙළ සුමඟට යොමුකිරීමට කළ සැබෑ මනෝවිද්‍යාත්මක චිකිත්සක ක්‍රමවේදයන් ය.

වරදට තලා, නිවැරැදිව හදා රජ පුටුවට රජුන් තැනූ තිලමුට්ඨි ජාතකය දරුවන් හරි මඟ යවන අයුරු අපට සිහිගන්වයි.

ඉගෙන කියාගත්කම පමණක් දරුවකු පූර්ණත්වයට පත් නොකරයි.

ගුණ නුවණ ප්‍රඥාව හා මුසුවීමෙන් චරිතයක් ශෝභමාන වෙයි.

**" දැන ඉගෙනගත් කම**
**තමයි කෙනකුගෙ වත්කම**
**ගුණ නුවණ දැක්කම**
**ඔහුට සලකයි රටේ ඔක්කොම"**


සිරිලක බබළවන අපේ දුව පුතා මල්කරුවකු මාලා ගොතන්නා සේ දින දින හොඳ ගුණ මල්දාමයට අමුණාගත යුතු ය. මල්යහනක් සේ පිවිතුරු දිවියක් එවිට හිමිවෙයි.

**"පොඩි පොඩි ඇළ දොළ එකතු වෙලා**
**සෑදෙනා ලෙස ලොකු ලොකු ගංගා**
**ටික ටික හොඳ වැඩ පුරුදු කරන කොට**
**හොඳටම හොඳ වෙනවා."**

දෑතට වැලිදෝතක් ගෙන මෙහි ඇති වැලිකැට ගණනට මගේ ජීවිතය එළි කර ගන්නට මට අවවාද ලැබේවා'යි රාහුල පොඩි හාමුදුරුවෝ සැමදා ප්‍රාර්ථනා කළ සේක. එපරිද්දෙන් ම මව්පිය, වැඩිහිටි, ගුරුවර, උපදෙසින් සිරිලක දරුපෙළ දින දින සුමඟට යොමු වේවා.

**"මල්වල සුමිහිරි පැණි**
**ඇද බොන බඹරා මෙනි**
**හොඳ ළමයා නුවණෙනි**
**හොඳ දේ තෝරා ගනී."**

මව්පියන් දැයට දායාද කළ යුතු මෙවන් ගුණ ඇති දරුවන් ය. කැපවීම, උත්සාහය තුළ එය අසීරු නොවේ. එවැනි දරුවකු ලද මව්පියන් සැබෑම වාසනාවන්තයින් ය.



# තමන්ගේ ගෞරවය ගැන හිතනවා නම් අනුන්ට අගෞරව නොකරන්න

**අසුරින්ද බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේ ඇසුරෙහි පැවිදි දිවියට එළඹීමෙන් පසු බිලංගික නම් බ්‍රාහ්මණයා ද බුදුරදුන් සමීපයට එළඹ, බැණ වැදීමට නොහැකිව සිතින් අපහාස කරමින් සිටියේ ය.**

මේ පිළිබඳ දත් බුදුරජාණන් වහන්සේ යමකු විසින් නිවැරැදි හා පිරිසුදු අයකු කෙරෙහි ක්‍රෝධයෙන් කටයුතු කරයි ද, බැණවදී ද, උඩු සුළඟට දැමූ දූවිල්ලක් නැවත තමා කරා පැමිණෙන්නේ යම් සේ ද, එසේම එහි විපාකය ද එම අනුවණයා කරාම එළඹෙන වග දේශනා කළහ.

ක්‍රෝධයෙහි විපාක දිට්ඨධම්මවේදනීය ලෙස විපාක දුන් අවස්ථාවක් පිළිබඳ ප්‍රවෘත්තියක් ධම්මපද අටුවාවේ දැක්වේ.

උදෑසනම සුනඛයන් පිරිවරා ආයුධ ද ඇතිව දඩයමේ යමින් සිටි කෝකාලික නම් වැද්දා භික්ෂුවක දැක "අද නම් කිසිදු දඩයමක් කර ගැනීමේ හැකියාවක් නොලැබේ" යැයි සිතා භික්ෂුව කෙරෙහි ක්‍රෝධ සිතින් එම භික්ෂුව දෙසට සුනඛයන් උසිගන්වන ලදී.

තැනට සුදුසු නුවණ භාවිත කළ භික්ෂුව ක්ෂණයෙන් ගසකට නැඟ ගත්තේ ය. ගස යටට පැමිණි වැද්දා විවිධ ආයුධ තුළින් භික්ෂුවගේ පාදයන්ට ඇන තුවාල සිදු කරන ලදී. භික්ෂුව විසින් බේරීමට තැත්කිරීමේ දී හදිසියේ ම සිවුර ගැලවී වැද්දාගේ ඇඟ මතට වැටුණි. භික්ෂුව බිමට වැටුණේ යැයි සිතූ බල්ලන් විසින් වැද්දා මරා දමන ලදී.

කෝපයේ විපාක අනුවණයා කරා එළැඹීමට වැඩිකල් ගත නොවන වග ඉන් තහවුරු වේ.

තවද, කෝපයේ විපාක ලෙස සසර ගමනේ දී ශරීර බිඳීම්, දරුණු වේදනාවන්ට හා රෝගයන්ට ලක්වීම්, නිස්කාරණ දෝෂාරෝපණ ආදීන්ට ලක්වන වග ධම්මපදයේ දසවන වර්ගයේ තවදුරටත් විස්තර කෙරේ.

කෝපය ඇතිවීමට බලපාන සාධක බොහෝමයක් ඇතත්, ඒ අතුරින් එක් හේතුවක් දීඝනිකායේ අම්බට්ඨ සූත්‍රයට අනුව මෙලෙස දක්වනු ලැබේ.

අම්බට්ඨ නම් බ්‍රාහ්මණයා දිනක් තරුණ ශාක්‍ය කුමාරවරු සාකච්ඡා කරමින් සිටින ශාලාවකට පැමිණියේ ය. කිසිවකු විසින් ඔහුට ගෞරවයක් නොදැක්වූ අතර, පැමිණ ඉඳගන්නා ලෙසට හෝ කිසිවකු විසින් ඇරයුම් කළේ නැත.

මේ නිසා කෝපයට පත් බ්‍රාහ්මණයා ශාක්‍යයන්ට බැණ වැදුණේ ය. එවිට බුදුරජාණන් වහන්සේ කැට කිරිල්ලියකට පවා උගේ කූඩුව තුළ කැමති සේ කතා කිරීමට හා හැසිරීමට නිදහස ඇති බවත්, එමනිසා තරුණ පිරිසක් අස්සට රිංගා ඔවුන්ගේ නිදහසට හානි කොට ඔවුන්ගෙන් නොලැබෙන ගෞරවයක් බලාපොරොත්තුවීම හිස් වූවක් බවත්, මෙවැනි සුළු දෙයකින් කිපීම කිසි ලෙසකින් නොකළ යුත්තක් බවත් දේශනා කළහ.


බුදුන් වහන්සේට පවා එකල අගෞරව කළ මිනිසුන් කොතරම් සිටියත්, උන්වහන්සේ කිසිවිටෙක කෝප නොගත්හ. ඒ, ආධ්‍යාත්මිකව සිත දියුණු කළ ඇත්තන් අන් අයගෙන් ගෞරව බලාපොරොත්තු වී කෝපයට හෝ ශෝකයට පත් නොවනා බැවිනි.

මෙම කරුණු නුවණින් විමසා, ලැබුණු මිනිසත් බව තුළ සැනසීම නැති කරන, ශෝකය වඩවන 'ක්‍රෝධය' නම් සිතිවිල්ල විෂ මුලක් මෙන් දැන, එය ඇතිවීමට බලපාන හේතු නැසීමට අප ප්‍රඥාවන්ත විය යුතු ය. ඒ තුළ ආධ්‍යාත්මික දියුණුව වර්ධනය කෙරෙහි සියල්ලෝ අධිෂ්ඨානශීලී වෙත්වා.






පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශයේ,
සහකාර කථිකාචාර්ය,
**මොරවක සිරි ධම්මරක්ඛිත හිමි**

## සුවඳ පද්මයක් වනු මැන හිමි සඳ

රන්වැලියෙ සෑ මළුව
සඳපානෙ පියනැඟුව
උදුළ රන් කසාවත
පුබුදුවයි සදැහැ සිත

පල්ලේගම හිමිසඳුන්
පා පියුම් මම වඳිමි

දනන් හෙළන සුසුමන් හද පුරවා
අතට රැගෙන පන්හිඳ ගී ලියනා
තවත් සියක්වස් ආයු ලැබ ගෙනා
සුවඳ පද්මයක් වනු මැන හිමි සඳ

පල්ලේගම හිමිසඳුන්
පා පියුම් මම වඳිමි

අනතිමාන ගුණයෙන් වූ පූජිත
නිබඳ මුවෙහි හසරැල්ලෙන් ලංකෘත
සසුනඹරේ පුන්සඳ සේ විකසිත
සමිඳ ඔබට පුදනෙමි හද බැති මල්

පල්ලේගම හිමිසඳුන්
පා පියුම් මම වඳිමි

අටමස්ථානාධිපති ධුරයට අභිනවයෙන් පත්වූ අතිපූජ්‍ය පල්ලේගම හේමරතන නාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස ය


ආචාර්ය
රත්නපාල වික්‍රමසිංහ

# අඳුරෙන් එළියට යන මඟ හෙළි කළ

# තිස්සා උපාසිකාවගේ සැදැහැ සිත



දඹාන මාවරගල ආරණ්‍ය
සේනාසනවාසී
රාජකීය පණ්ඩිත,
ශාස්ත්‍රපති, අධ්‍යාපනපති
**පදියතලාවේ
අමරවංශ හිමි**

**සද්ධාතිස්ස රජතුමා රාජ්‍ය කරන කාලයේ රුහුණු රටේ තිස්සම්බතොට නම් ගමේ මුණ්ඩකගුත්ත නම් එක් දුප්පත් මනුෂ්‍යයෙක් විසුවා. ඔහුගේ භාර්යාව තිස්සායි. ඔවුන්ට එක පුතෙක් සිටියා.**

කුලී වැඩ කරමින් ජීවත් වූ මුණ්ඩකගුත්තට දින ගණන් හෝ සති ගණන් ඇතැම් විට වැඩක් ලැබෙන්නේ නෑ.

පවුලේ අගහිඟකම් පිරිමසා ගන්න එවැනි අවස්ථාවල දී ණයට මුදල් ගත්තා. කලක් ගත වන විට කහවණු සැටක් ණය වී තිබුණා. ගෙවා ගැනීමට නොහැකි නිසා ධන හිමියාට සේවය කරන්න සිදු වුණා. ගම්වැසියෝ කණ්ඩායම් වශයෙන්, පවුල් වශයෙන් හා ඥාතීන්, හිතමිතුරන් වශයෙන් එක්වී සංඝයා වහන්සේට දන් දෙන්න පටන් ගෙන තිබුණා. මුණ්ඩකගුත්තටත් දන් දෙන්න ආශාවක් උපන්නා. ඒත් දාන කළ මනා ගන්න මුදල් නැතිව පසුතැවුණා. බිරිඳටත් එම සිතිවිල්ලම පහළ වුණා. දවසක් සැමියා අමතා

"ස්වාමිනි, අප පෙර ආත්මවල දන් නො දුන් නිසා මෙසේ දුප්පත් වී ඉපදුණා. මේ ආත්මයේ කෙසේ හෝ දන් දී පින් රැස්කර ගන්න ඕන, ගම්වැසියෝ හැමෝම වගේ දන් පැන් සංඝයා වහන්සේට පිරිනමා පින් අත්කර ගන්නවා. අප කරන්නේ කුමක් දැ"යි විමසා සිටියා.

"මරණය අද හෝ හෙට හෝ පැමිණේ දැයි අප දන්නේ නෑ. රළු හෝ ප්‍රණීත හෝ ආහාරයක් කෙසේ හෝ අපි දන් දෙමු"යි පවසමින් පිළිතුරු දුන්නා.

දිනක් සැමියා ධන හිමියාගේ නිවසේ සේවයට ගිය අවස්ථාවේ තිස්සා උපාසිකාව කාඩි බත් කැඳක් හැදුවා.

එහෙත් එයට දාන්න ලුණුවත් තිබුණේ ණෑ. තුනුරුවන් කෙරෙහි සිත පහදවාගෙන ශ්‍රද්ධාවෙන් යුතුව ඒවා හිස මත තබාගෙන සංඝයා වහන්සේ රැස්වන ශාලාවට ගෙන ගියා. ඒදින එහි වැඩ සිටියේ ගිහි ජීවිතය විඳ වයසට ගොස් පැවිදි වූ හිමි නමක්. උන්වහන්සේගේ පාත්‍රයට පිළිගන්වා ඒවා වළඳන තෙක් ශ්‍රද්ධාවෙන් බලා සිටියා. ඒ භික්ෂුව ලුණු නැති කාඩි බත් කැඳ ඇය බලා සිටිය දී ම ඉවත දමා පාත්‍රය සෝදා ගත්තා.

තිස්සා උපාසිකාවට මහත් සිත් වේදනාවක් උපන්නා. නිවසට පැමිණ ඇඳෙහි වැතිරී හඬන්නටත්, වැළපෙන්නටත් පටන් ගත්තා. සැමියා පැමිණ ඇයගෙන් තොරතුරු විමසුවත් පැවසුවේ නෑ. නැවත නැවතත් විමසා සිටි විට සියලු පුවත් දන්වා සිටියා.

බිරිඳගේ ශ්‍රද්ධා සිත ඉටුකර දීමට ඔහු තීරණය කළා. හෙතෙම තම පුතා කහවණු අටකට වෙනත් පවුලක සේවයේ යෙදෙව්වා. ලැබුණු මුදලින් කිරි ගවයෙක් මිල දී ගත්තා. නොබෝ දවසකින් ම ඇය පැටියකු වැදුවා. දැන් උදේ සහ සවස කිරි දොවනවා. තිස්සාවගේ ශ්‍රද්ධා මහිමය නිසා ම නැළි හතර බැගින් ලැබුණා. ඒවා දොවා ගත් සැණින් ගිතෙල් බවට පත් වෙනවා.

ගිතෙල් නැළි දෙකක් උදේට දොවා ගන්නවා. එයින් ගිතෙල් මිශ්‍ර බත් සකසා සංඝ රත්නයට පූජා කරනවා. සවස දොවා ගන්නා ගිතෙල් නැළි දෙකින් ගිතෙල් පහන් පූජා කරනවා.

මේ පුවත ගමේ සිටි රාජපුරුෂයකුට අසන්න ලැබුණා. සේවකයකු ලවා පණිවිඩයක් ඔවුන්ට එවනවා ලැබෙන ගිතෙල්වලින් තමාටත් කොටසක් දෙන ලෙසට. පණිවිඩය ගෙන ආ පුද්ගලයා අමතා මුණ්ඩකගුත්ත "පින්වත, ගව දෙනගෙන් ලැබෙන ගිතෙල් බිඳුවක්වත් අප භාවිත කරන්නේ නෑ. සංඝයා වහන්සේ වෙනුවෙන්මයි ඒවා වෙන් කරන්නේ. ඒ නිසා ගිතෙල් දිය නොහැකියි" යැයි පවසා සිටිනවා. මේ පුවත රාජපුරුෂයාට දන්වනවා. එයින් ඔහු කෝපයට පත් වෙනවා. ඒ පුවත මුණ්ඩකගුත්තට අසන්න ලැබී "මේ අසත්පුරුෂයා රජුට අප ගැන දොස් කියා අපගේ මේ පින්කම්වලට බාධා පමුණුවන්න පුළුවන්. ඒ නිසා නැළි භාගය බැගින් ඔහුට දෙනවා "යි තීරණය කර දිනපතා ඔහුට ගිතෙල් නැළි භාගයක් දුන්නා. නොබෝ කලකින් සේවය සැපයීමට රජමාළිගයට යාමට ඔහුට සිදු වෙනවා. මේ පුවත දැනගත් මුණ්ඩකගුත්ත එදා පටන් නැවතත් ඔහුගේ නිවසට ගිතෙල් යැව්වේ නෑ. කලක් ගත වී නිවසට පැමිණි විට මේ පුවත ඔහුට අසන්න ලැබී නැවතත් සේවයට වාර්තා කළ අවස්ථාවේ රජතුමා අමතා

"ස්වාමිනි, රජුන්ට දිය යුතු ගව රස සඟවාගෙන මුණ්ඩකගුත්ත නම් තැනැත්තා භුක්ති විඳිනවා"යි දන්වා සිටිනවා. "එසේ නම් ඔබ ම ගොස් ඒ ගව දෙනත්, තවත් ගවදෙනුන් සියයකුත් රැගෙන එන්න"යි ඔහුට ම පවරනවා. රාජපුරුෂයා මුණ්ඩකගුත්තගේ නිවසට ගිහින් ගව දෙනත්, තිස්සා උපාසිකාවත්, මුණ්ඩකගුත්තවත්, ගවදෙනුන් සියයකුත් අරගෙන රාජමාළිගාවට පැමිණ රජුට දන්වනවා. රාජ දේවියට නියෝග කරනවා සියලු ආභරණවලින් සැරසී අරුම පුදුම ගව දෙනගෙන් කිරි දොවන්නට. දේවිය කොතරම් උත්සාහ කළත් එක කිරි බිඳුවක්වත් ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නෑ. රජතුමා තිස්සා උපාසිකාවත් රාජ දේවිය සේම සරසවා කිරි දොවන්නට අණ කරනවා.

"එසේ ය දේවයන් වහන්ස"යි පවසා ඇය ගවදෙනගේ තනපුඩුවට අත තබනවාත් සමඟ කිරි ඉබේට ම වැගිරෙන්න පටන් ගත්තා. ඇය ගිතෙල් නැළි ගණන් පුරවා රජුට පෙන්වනවා. රජතුමා මහත් සේ පුදුමයට පැමිණ එයට හේතු විමසා සිටිනවා.

එවිට තිස්සා උපාසිකාව

"රජතුමනි, අප බොහෝ සේ දුප්පත්, ණයක් ගෙවා ගැනීමට නොහැකිව කුලී සේවයේ යෙදෙනවා. දනක් දීමට වත්කමක් නෑ. එමනිසා අපගේ එකම පුතු උගසට සේවයේ යොදවා ලබා ගත් මුදලින් මේ ගව දෙන මිල දී ගත්තා. ලැබෙන ගිතෙල් බිඳුවක්වත් අප භාවිත කළේ නෑ. තෙරුන් වහන්සේලාට දන් දීමටත්, පහන් දැල්වීමටත් යෙදෙව්වා"යි කියා සිටියා.

රජතුමා සතුටට පත් වී ඔවුන් ණයෙන් මුදවා තිස්සම්බතොට ගම හිමි කර දුන්නා. භේධකාරී රාජපුරුෂයා ඔවුන්ගේ සේවකයා බවට පත් කළා.

නුවර සමීපයේ ආරාමවල වැඩ සිටි භික්ෂූන් වහන්සේ වැඩමවා දන් පිරිනමා තිස්සා උපාසිකාවගේ ශ්‍රද්ධා මහිමය දන්වා සිටියා.

අඹුසැමි දෙදෙන බොහෝ කුසල් දහම් කොට දිවි කෙළවර දෙව්ලොව උපන්නා.

**ඒ භික්ෂුව ලුණු නැති කාඩි බත් කැඳ ඇය බලා සිටිය දී ම ඉවත දමා පාත්‍රය සෝදා ගත්තා. තිස්සා උපාසිකාවට මහත් සිත් වේදනාවක් උපන්නා. නිවසට පැමිණ ඇඳෙහි වැතිරී හඬන්නටත්, වැළපෙන්නටත් පටන් ගත්තා.**



දුප්පත් වී උපත ලැබුවත්, තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් කටයුතු කරමින් වාසය කරන්නාටත්, සංඝයා වහන්සේ උදෙසා දන් පැන් පිරි නමන්නාටත්, ආහාරපානවල හිඟකමක් කිසිදා ඇති වන්නේ නැති බවත්, දන්දීමේ විපාක මේ ආත්මයේ දී ම විපාක දෙන බවත්, තමන් උපයා ගත් දෙයින් කුඩා දෙයක් හෝ ශ්‍රද්ධාවෙන් දන් දීම වැදගත් බවත් මේ කතා පුවතින් අපට කියා දෙනවා.

# සහලේනෑයන්ට මතක දානයෙහි පින ලැබෙන නොලැබෙන හැටි



*මෙම ලිපියේ මුල් කොටස ඉල්පුර පසළොස්වක පෝදා (07) පුවත්පතේ පළවිය.*

**මළගිය අය තමාට කළ සුළු හෝ උපකාරයක් ජීවත්ව සිටියදී කළේ යැයි සිහි කෙරෙමින් ඔවුන් උදෙසා දන් දිය යුත්තේ ය.**

- මරණයත් සමඟ ම ක්ෂණයෙන් ඊළඟ භාවොත්පත්තිය ලැබුවකුට හැඬීමෙන්, වැළපීමෙන්, ප්‍රයෝජනයක් නොවේ. (තමන්ට වෙහසක් පමණි)
- මහ රජ (ඔබ විසින් අද තමන්ගේ පරලොවකට ගිය) නෑයන් උදෙසා යම් දානයක් දෙන ලද්දේ ද, ඒ දානය (නිරුත්තර පුණ්‍යක්ෂේත්‍ර හෙයින්) සංඝයා කෙරෙහි සුපිහිටියේ හෙයින් (ආයු –වණ්ණ –සැප – බල ලෙසින්) ප්‍රේත සමූහයාට දීර්ඝ කාලයක් හිත සැප පිණිස විපාක දෙයි. ඒ කෙණෙහිම (ඨාන සො හේතුඵල සහිතව) පහළ වීම් වශයෙන් විපාක දෙයි. (කම්ම හා ධම්ම න්‍යායන්ගේ ආශ්චර්ය අද්භූත ස්වභාවය බුද්ධ දර්ශනය බුද්ධ ධර්මය හරහා පමණක් ම විමසා බලමු.
- මේ දක්ෂිණාව දෙන්නා වූ ඔබ විසින් නෑයන් විසින්, නෑයන් සඳහා කළ යුතු වූ ඥාති ධර්මය දක්වන ලදී. (හැඬීම් වැලපීම් ඥාති ධර්ම නොවේ) ප්‍රේතයන් ප්‍රේතභාවයෙන් මුදවා දිව්‍ය සම්පත්තියට පමුණුවන්නා වූ ඔබ විසින්) ප්‍රේතයන්ට මහත් වු පූජාවක් ද කරන ලදී. භික්ෂූන්හට ශක්තිය දෙන ලදී. ඔබ විසිනිදු මහත් වූ පිනක් රැස් කර ගන්නා ලදී.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ බිම්බිසාර රජතුමා විසින් දන් ලැබීමට සුදුස්සන් (දක්ෂිණාර්හ පුග්ගලො) තෝරා දෙන ලද දානයෙහි (මෙවැන්නන්හට දන්දීමෙන් ලැබෙන පින් මහත් ය) සාර්ථක භාවය දක්වමින් කළ තිරෝකුඩ්ඩ සූත්‍ර දේශනාව ඇසූ බොහෝ දෙනා ධර්මාවබෝධය ලැබුවෝ ය. (තිරෝකුඩ්ඩ සූත්‍රය නිමි)

මාතෘකාවට අදාළව පහත කොටස ද කියවා ඉහත සූත්‍ර දේශනාව පිළිබඳ යම් සැකයක් (විචිකිච්ඡාවක්) වූයේ නම් අපි එය පහකර ගනිමින් “මළගිය ඥාති ධර්මය” හැකි හැම විටකම කර ගනිමින් කළ උපකාරයට ප්‍රතිඋපකාර කරන්නෝ වෙමු.

එය ද මෙසේ ය. ඉහත සූත්‍රයේ 5 වෙනි ගාථාවේ “දායකාච අනිප්ඵල” යනුවෙන් බුදුරජාණන් වහන්සේ වදාළ දහම් පදයක් ඇත. යමෙකු ගේ සිතෙහි පරිත්‍යාගමය කුසල කර්මයක් කරන ලද්දේ ද ඔහුට එහිදී ම ඵලය ලබාදීම මගින් දානය දුන් දායකයා ද ඵල රහිත වූවෝ නොවෙති.” යනු එහි අදහසයි.

මේ අදහස ලඝු කොට සැහැල්ලුවෙන් යමෙක් ගන්නේ නම්, ඥාති ධර්මය සලකා අපි දෙන දානයෙහි පින් ගැනීමට අපේක්ෂිත අපේ නෑයා එතැනට නො පැමිණියේ නම් දන් දුන් කෙනා අත්කරගත් පින් ඵල රහිත වේ ද යනුවෙන් අදහසක් සමාජ ගතව ඇද්ද? මේ අදහස අදට පමණක් නොව ජීවමාන භාග්‍යවතුන් වහන්සේ කාලයේ දී ද පැන නැඟීමෙන් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වදාළ පිළිතුරු දේශනාවකි.

(ජාණුස්සෝණි සූත්‍රය + අං.නි.6 -පිටුව 490)

ජාණුස්සෝණි බමුණා ඉතා ධනවත් මහාසාර කුල මහ පඬිවරයෙකි. මොහු එවකට විසූ චාණක්‍යන, තෝදෙය්‍ය, තාරුකඨ පොක්ඛරසාති, වැනි බමුණු මහා පඬිවරුන් සමීපව ඇසුරු කළ අයෙකි. ත්‍රිපිටකාගත සූත්‍ර අතර මජ්ඣිම නිකාය 1.චූලහත්ථිපදෝපම සූත්‍රය, සංයුත්ත නිකාය 2. නිදාන සංයුත්තයේ ගහපති වග්ගයේ ද භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ හමුව සාකච්ඡා පවත්වා තෙරුවන් සරණ ගිය උපාසකයෙක් ද වේ.

අංගුත්තර නිකායේ එන මෙම සූත්‍රයේ ද ජානුස්සෝනි බමුණා භාග්‍යවතුන් වහන්සේ වෙත එළැඹ සතුටුවිය යුතු සිහි කටයුතු කතා කොට නිමවා එකත්පස්හි හිඳ මෙසේ ඇසීය. පින්වත් ගෞතමයන් වහන්ස. බ්‍රාහ්මණ අපි, පරලොව ගිය නෑයින් සිහිපත් කර දන් දෙන්නෙමු. මේ මතක දානය නෑයන්ට පැමිණෙත්වා'යි ප්‍රාර්ථනා කරන්නෝ වෙමු. භවත් ගෞතමයන් වහන්ස, ඒ දානය නෑ සහලේ නෑයින්ට පැමිණේ ද? ඔවුහු ඒ දන් පරිභෝග කරත් ද?

බ්‍රාහ්මණය, සුදුසු අවස්ථාවෙහි පැමිණෙන්නේ ය. නුසුදුසු අවස්ථාවෙහි (අස්ථානයෙහි) නොපැමිණෙන්නේ යැයි. භාග්‍යවතුන් වහන්සේ වදාළහ.

භවත් ගෞතමයන් වහන්ස, සුදුසු (ස්ථාන) අවස්ථා හා නුසුදුසු (අස්ථාන) අවස්ථා කුමක්ද? (දස කරුණක් දේශනා කළ සේක)

- බමුණ, මෙලොව ඇතැමෙක් ප්‍රාණඝාත, සොරකම්, කාමයෙහි වරදවා හැසිරීම්,.....ක්‍රෝධ බහුලව මිථ්‍යාදෘෂ්ටිකාදී වෙයි. ඔහු මරණින් මත්තෙහි නිරයට යෙයි. එහි නිරිසතුන්ගේ යම් ආහාරයක් වේ ද එයින් ඔහු යැපෙයි. බමුණ එවන් තැනක සිටියහුට මේ මතක දාන පින් නොපැමිණේ. මෙය අස්ථානයෙකි.
- බමුණ මෙලොව ඇතැමෙක් ප්‍රාණඝාතාදී දස අකුසල් ම කරන්නේ වෙයි. මරණින් මතු තිරිසන් ව උපදී. ඔවුනට යම් ආහාරයක් වේ ද එයින් යැපේ. ඔවුනට ඒ දානය නොපැමිණේ. මෙය අස්ථානයෙකි.
- බ්‍රාහ්මණ ය. මෙලොව ඇතැමෙක් ප්‍රාණඝාතාදී දස අකුසලින් වැළකී සම්මාදිට්ඨික වෙයි. ඔහු මරණින් පසු මනුෂ්‍යත්වය ලබයි. මිනිසුන්ගේ යම් ආහාරයක් වේ නම් එයින් යැපෙන්නේ ය. මනුලොව සිටී ද ඔවුනට ඒ දානය නොලැබේ. මෙය ද අස්ථානයෙකි.
- බ්‍රාහ්මණය, මෙලොව ඇතැමෙක් ප්‍රාණඝාතාදී දස අකුසලෙන් වැළැකියේ සම්මා දිට්ඨී වූයේ මරණින් මතු දෙවියන් හා එක්වෙයි. දෙවියන්ගේ යම් ආහාරයක් වේ නම් එයින් යැපේ. ඔවුනට මේ දානය නොලැබේ. මෙය ද අස්ථානයෙකි.
- බ්‍රාහ්මණය. මෙලොව ඇතැමෙක් ප්‍රාණඝාතාදී දස අකුසල් කෙරේ, මිථ්‍යාදෘෂ්ටික වෙයි. ඔහු මෙලොව මරණින් පසු ප්‍රේත විෂයයට එළැඹෙයි. එහි යම් ආහාරයක් වේ ද එයින් යැපේ. මිය ගිය ඔහුට නෑයෙක්, සහලේ නෑයෙක් මිත්‍රයෙක් වෙත් නම් ඔවුන්ගෙන් කිසිවෙක් මෙවන් මතක දානයක් දෙත්නම් “හේ ඉන් යැපෙයි. බ්‍රාහ්මණය, (ප්‍රේත විෂ යයෙහි) යම් තැනෙක සිටියහුට ඒ දානය එළැඹේ. ඒ ස්ථානයෙකි.
- මෙහිදී බමුණා, පින්වත් ගෞතමයන් වහන්ස, පරලොව ගිය ඥාතියෙක් එතැනට නො පැමිණියේ නම්, කවරෙක් ඒ දානය පරිභෝග කෙරේදැයි? ඇසීය.
- බ්‍රාහ්මණය, පරලොව ගිය වෙනත් නෑයෙක් ලේ ඥාතියෙක් එතැනට පැමිණියාහු වෙත්. ඔහු ඒ දන් පරිභෝග කරයි. මේ ස්ථානයකි.

භගවත් ගෞතමයන් වහන්ස, පරලොව ගිය (අපේක්ෂිත) නෑයා ලේ නෑයා එතැනට නොපැමිණියේ නම්, කවරෙක් ඒ දන් වළඳන්නාහු ද? ඇසීය.

ජාණුස්සෝණි බමුණා ඉහත ප්‍රශ්නය ඇසුවේ මෙසේ දෙන ලද දානයාගේ ඵලය දායකයා නොලබතැයි යන ලබ්ධියෙන් සිට බව භාග්‍යවතුන් වහන්සේ දැන මේ පිළිතුර දුන් බව අටුවාව දක්වයි.

- බ්‍රාහ්මණය, යම් හේතුවකින් මේ (මුලක්–අගක් නොපෙනෙන) දීර්ඝ සසර ගමනේ එවන් පරලොව ගිය නෑයකුගෙන් හිස් වන්නේ ය යන කරුණ විය නොහැක්කෙකි. එය අස්ථානයෙකි. එයට ඉඩක් නැත. එසේ හෙයින් දන් දෙන්නා ද නිෂ්ඵල නොවේ.

භවත් ගෞතමයන් වහන්ස, දානයක විපාක අස්ථානයෙහි ද ලැබෙන බව මුලින් වදාළ සේක. ඒ කවරෙක් ද?

- බ්‍රාහ්මණය ඒ මෙසේ ය. මෙලොව ඇතැමෙක් ප්‍රාණඝාත කරන්නේ වෙයි. මිථ්‍යා දෘෂ්ටික වෙයි. එහෙත් හෙතෙම පැවිදි මහණ බමුණන්ට ආහාර පාන, වස්ත්‍ර, යාන, මල්විලවුන්, ආවාස, ප්‍රදීප දෙන්නේ වෙයි. හෙතෙම මරණින් මත්තෙහි තිරිසන් ලොව හස්තින් ඇතුන් අතර උපදී. එහෙත් ඔහු ආහාර පාන මාලා ආදී අලංකාරයන් ලබන්නේ ය. (මංගල හස්ති වේ)
- බ්‍රාහ්මණය, මෙලොව ඇතැමෙක් දස අකුසල් ම ඇත්තේ වෙයි. එහෙත් ඔහු මහණ බමුණන්ට දන් දෙන්නේ වෙයි. ඔහු මරණින් පසු අශ්ව. ගව සුනඛව ඉපිද ආහාරපාන නානා අලංකාර සැප ලබන්නේ වෙයි. (ආජානීය, අශ්ව, ආජානීය වෘෂභ (ගව) ස්වභාවය) (සුනඛ ස්වභාවයට ගියත් සැප ලබන්නමෝ වෙයි)
- බ්‍රාහ්මණය, මෙලොව ඇතැමෙක් දස අකුසලින් වැලැකුණේ වෙයි. (සම්මා දෘෂ්ටික වෙයි) මහණ බමුණන්ට අවශ්‍ය දෑ දන්දෙයි. මොවුහු මිනිස් ලොව ඉපිද මිනිස් ලොව පස්කම් සැප ලබන සුලුවෙයි. මරණින් මතු දෙවියන්ගේ ස්වභාවයට පැමිණෙයි. එහි දෙවියන් සතු පස්කම් ගුණ ලබන්නේ වෙයි. (සදෙව්ලොවක් වේ)

එහෙයින් බ්‍රාහ්මණය. දානයක් දුන් දායකයා ප්‍රතිඵල නැත්තෙක් (අනිෂ්ඵල) නොවේ.

භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්යයි. අද්භූතයි. පින්වත් ගෞතමයන් වහන්ස, යම් යම් දානයන් හි ලා දායකයා ද නිෂ්ඵල නොවේ. දන්දීම සුදුසු ම ය. එම කරුණ අදහන්නට සුදුසු ම ය. බ්‍රාහ්මණය, මේ කරුණ එසේ ම ය. මේ කරුණ එසේ ම ය. දායකයා ද නිෂ්ඵල නොවේ. (අපිදු සැකයෙන් තොරව කළගුණ ඇත්තකු ලෙසින් ඥාති ධර්මය සිහිකොට මහ සඟරුවනට නිති දන්දෙන්නෝ වෙමු)

ත්‍රිපිටක පරිවර්තන මණ්ඩලයේ ලේකම් ( බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව බුද්ධශාසන අමාත්‍යාංශය)
**කේ.කේ. සුගතපාල**



# පහන් සිතක කවි



සංස්කරණය
දීපා පෙරේරා

## දිගුකල් දිනේවා!

80 විය සපිරෙන
ගෞරවනීය කිරිඳිගල්ලේ
ධම්මරතනාභිධාන අප
ගුරු දේවයන්
වහන්සේ වෙත
පිදෙන කාව්‍ය
කුසුමාංජලියයි

හතළිස් දෙකේ ඉල් මස දාහත් වැනි දා
මේ ලොව එළිය විය පින්බර පුතු හන්දා
සිරිමල් වියේ දී ම කහවත ගත රන්දා
සසුනට එක් වුණා හිමි ගුණ කඳ හින්දා

අරඹා ගමින් මාරතුගොඩ විදුමැණික
වඩවා ගුණ දහම් දරුවන් මෙ සිරිලක
කරවා ලොව දසත පන්සල් වෙහෙර නෙක
සැනසෙමු අපිත් අද නා හිමි ගුණය දැක

යුරෝපයේ සඟ නායක පදවි ගෙන
නෙක නෙක රටවලට වැඩලා දහම් ගෙන
සනසා බොදුණු හදවත් බුදු මගම ගෙන
නා හිමිසඳුණි බෝ කල් තව වැඩ ඉන්න

දෑ හිතකාමි සිසු පරපුර හදාලා
ලොවට ම දහම් දෙසුමට මඟ තනාලා
කාගෙත් සිත්වලට අම බිඳු පොවාලා
හිමි සුව විඳියි දහමින් සිත නිවීලා

රට ජාතිය ද ආගම හා සසුන් කෙත
ඔපවත් කරයි කාටත් ගෙන දෙමින් සෙත
පින්බර අසූවිය සමරන දහම් කෙත
දිගුකල් දිනේවා දම් මිණ සියත් පත

මධ්‍යම පළාත් භාර පිරිවෙන් අධ්‍යාපන අධ්‍යක්ෂ
**ආචාර්ය කිරිඳිගල්ලේ ඤාණරතන හිමි**

## මෙතෙරින් එතෙරට

අනුන්ගෙ වැරැදි සොය සොය යන සංසාරේ
පිනකට ලැබුණ මිනිසත් බව මේ වාරේ
දුර්ලභ උපත ගෙන නැවතත් පෙර සසරේ
කළ කී දෙය ද කරමින් ඉන්නේ සොයුරේ

තමන්ගෙ කුඹුරෙ වල්පැළ නොගලවා ඉඳන්
අනුන්ගෙ කුඹුරෙ වල් පැළ ගලවනව සැණින්
කුඹුරේ අඩුපාඩු නොපෙනෙන ගොවියාගෙන්
වල් අස්වනු පමණි ගත හැකි සිය කුඹුරෙන්

තමාගෙ පිහිට තමහටමයි සැමදා ම
අනුන්ගෙ පිහිට ගෙන හිටියොත් වැනසීම
දහමේ පිහිට ගෙන සිටියොත් සැනසීම
ලැබෙනා බවයි බුදුහිමියන්ගේ දෙසුම

කලණ මිතුරු සෙවණින් ඕවාද ගෙන
යා යුතු අරිය මඟ පිරිසිඳුව දැන ගෙන
මතු ඉඟි කරන්නට පෙර දුක හඳුනගෙන
පිම්මක් ගසමු මෙතරින් එතරට යැවෙන

**බිබිලේ ධම්මසිරි හිමි**
කපුවත්ත සේනාසනය
දෙහිඅත්තකණ්ඩිය

## දුක හිතෙන කතාවක්

ටවුමේ පාසලේ ලොකු මහත්තයාට
පුදන්න ලොකු සල්ලි නෑ තාත්තා ළඟ
ශිෂ්‍යත්වය ඉහළින් ම පාස් වුණත් මම
පාසල් බසයට දෙන්නට සල්ලි තිබුණෙත් නෑ


කටු මැටි බිත්ති පැලේ පොල් අතු සෙවිළි අතර
එකම වත්කම වී බුසලක කුඹුර පමණි
මගේ ඉගෙනීම දුප්පත්කමින් යට වුණා
වී බුසලක කුඹුරටම මා සින්න වුණා

උදලු මිටේ වියළි සිනිඳු මතු පිටට
දෙඅත්වල රේඛා එක් වුණා නොදැනීම
කරගැට දැත්වල සිත්තම් කළේ
දුප්පත්කමින් ඉගෙන නොගත් එකේ තරමයි


දවස පුරා ලියදි ගානේ ඇවිදලාම
යටි පතුල් පැලී ඒ අස්සට මඩ රිංගලා
ඒ මඩ සේදීමට ඇලට ගිය කල
දියෙන් බැලුවෙමි මදෙස රජකමට සුදුසු දැයි

නෑ විසුමක් අව්වෙන් මා හට
රිදුම් දෙනවා ගතම කළු කර
පුරාකෘත අකුසලයක මහත
විඳවමි මා වී බුසලක කුඹුරට වී

**දේවගිරියේ පඤ්ඤානන්ද හිමි**
බෝධි රාජමහා විහාරය, තල්පිටිය, වාද්දුව



## වඳිනෙමි සිරි දළදා



වැව බෝගම්බර
දළදා ගම්බිර
වැඩමවූ මේපුර
බලන් අසිරි පෙර

හේමමාලාවන්
දන්ත කුමරුවන්
දඹදිව් තලයෙන්
දළදා වැඩුමෙන්

වම් මුනි දළදා
වැඳ පුදා ගත් දා
සිහිවන හින්දා
කවිපද බැන්දා

**අජිත් වික්‍රමනන්ද වීරසූරිය**
මොරගොල්ල
ඉබුල්ගස්දෙණිය

## අට මහ කුසල්

බුදු හිමි ප්‍රමුඛ මහ සඟ වෙත දන් පිදුම
සුදු මුදු ප්‍රතිමා ද පූජාවට සැදුම
හුදු කඨිනය දාන පින්කම නැත හැරුම
කුදු මහ දනන් අටපිරිකර පිදූ නිතිම

සදවා ආවාස මහ සඟනට පිදුම
බඳවා වැසිකිළි ද පවරාලන යෙදුම
සොඳවා කෙත්වතු ද පූජාවට පැතුම
යෙදුවා නම් ධර්ම දානය ම යි හොඳම

සඳහන් ඉහත කරුණු ය අට යහ පිදුම
රැඳවෙන් මතු භවය හොඳ ගමනක සැදුම
මුදුනෙන් පිළිගැනෙන දහමේ එන පුදුම
බැඳුනෙන් අට කුසල සුගතිය වෙයි සැදුම

විශ්‍රාමලත් පරිවේණාචාර්ය
**ජී.බී. ගුණරත්න**

## පින්බර නැඟණියනි

මැදියම් රැයේ
නටුවෙන් ගිලිහී වැටෙන
සේපාලිකා මලක්වන් ඔබ
සුපිපී ගත හා වත
දිරන දරකඩක් සේ දැක
මොහොතක සුව දෙන
දෙතිස් කුණපය ගැන
නැණ මඩල විවර කොට
බුදු සුවඳ ගල්වා
සියොළඟ
සැනසෙන්න
සසර දුක් නිවා

**මාස්පොත ධම්මජෝති හිමි**
මීරිගම



## මව් සෙනෙහස ...



දසකඩ මසක් කුස තුළ මා හොවාගෙන
අපමණ දුකක් මා වෙනුවෙන් දරාගෙන
සිත තුළ බියක් නොතබා පසු නොබාමින
සුන්දර ලොවක් ඇත දැන් ඔබ දිනාගෙන

මා වෙනුවෙන් ඉපදුණු දරු සෙනෙහසට
ගතේ රුහිරු හැරුණේ රන් කිරිවලට
සම නොම වේ මේ ලොව අන් කිසිවකට
අම්මේ ඔබ මට දුන් සෙනෙහසට

**ඒ.එම්.අබේසිංහ බණ්ඩා**
මාපනාවතුර– මහනුවර

## නුවණ

මගේ ලොවට බුදු සමිඳු වඩිනවා
බුදු සමිඳුගෙ ගුණ හැඳින ගන්නවා
ඒ ගුණ බලයෙන් නුවණ වඩනවා
නුවණ ලබා ගෙන නිවන් දකිනවා

**ජී.රත්නා තල්වත්ත**
බලන්ගොඩ

බුදුසරණ
## පහන් සිතක කවි

BCC

සම්පූර්ණ නම :– ..............................................................
ලිපිනය :– ..............................................................
දුරකථන අංකය :– ..............................................................

අව අටවක, අමාවක, පුර අටවක, පසළොස්වක
සතර පෝදටම ඔබේ නිර්මාණ 'පහන් සිතක කවි' පිටුවේ පළවේ.
ඔබගේ කාව්‍ය නිර්මාණ කූපනය සමඟ පහත ලිපිනයට යොමු කරන්න.
සංස්කාරිකා,පහන් සිතක කවි, බුදුසරණ කර්තෘ මණ්ඩලය, ලේක්හවුස් - කොළඹ.

දුටුගැමුණු මහ රජතුමා

88 කොටස

# අඹතොට කඳවුර ජය ගැනීමට විහාර මහා දේවියගේ උපායක්

**"බෝධිනාග හයෙන් පසුවෙනවා අපේ රහස් ලබා ගන්නා ඔත්තුකරුවකු පිළිබඳව. එය ගැන අපට මහත් කරදරයක්. මේ ගැන සොයා බලන්න සිරිනාගට පුළුවන් නේද?"**

"මහ රජතුමනි, මේ ඔත්තුකරු බලන්නේ මා ගැනම නිසා මට එය කළ නොහැකියි. මට දින කිහිපයකට කලින් ලැබුණු තල්පතකින් ඒ බව ඔප්පු කළ හැකියි. මා අග නගරයෙන් ටික දිනකට බැහැරව ඉන්නට අදහස් කළෙත් ඒ නිසයි."

තොප කියන්නේ අපේ තවත් රහස් දුටුගැමුණු රජුට දැන ගන්නට ලැබී ඇති බවද?" රජතුමා පුදුමයෙන් ඇසීය.

දීඝජන්තු විපිළිසරව සිරිනාග දෙස බලා සිටියේ ය. දීඝාභය ද විමතියට පත්ව සිටින බව මුහුණෙන් පිළිබිඹු විය. රාජ සභාවේ සියලු දෙනාම මීළඟට සිදුවන්නේ කුමක්දැයි පුදුමයෙන් බලා සිටියහ. සිරිනාග තමාගේ කඤ්චුකය තුළ තිබූ තල්පත ගෙන දීඝජන්තු අත තැබීය.

"කියවන්න හැමෝටම ඇසෙන්න කියවන්න" රජතුමා කීවේ කෝපයෙනි.

"දුටුගැමුණු යුද බිමෙන් සහ මාගමින් රහස් ඔත්තු ලබා ගන්නා සිරිනාග නම් සිංහල සෙනෙවියෙක් මෙහි සිටිනවා. ගැතිකම් කරමින් සූක්ෂ්ම ලෙස එළාර රජුගේ විශ්වාසය දිනාගෙන සිටින ඔහු ඔත්තු ලබාගන්නේ ගුත්තාහල කඳවුරෙන්" යනුවෙන් සඳහන් තල්පතක් දාඨාසේන සෙනෙවිතුමාට ලැබිලා. මහසෙනෙවිවරුන් අපි ගැන සොයනවා. ඒ නිසා අපි ටික කලකට නිශ්ශබ්දව සිටීමට තීරණය කළා."

තල්පත කියවීමෙන් පසු රාජ සභාව තුළ පැවතියේ දැඩි නිහඬ බවකි.

"සිරිනාග තොපේ පණිවුඩ ගෙන එන පරෙවියා අතුරුදහන් වී ඇති බව තොප පැවසුවේ මේ රාජ සභාවේදීම යි. දැන් තොප කියන්නේ කුමක්ද?"

"ඌ ටික දවසක් අතුරුදහන්ව සිටියා. ආයෙත් ආවා. ඌ දක්ෂ රහස් පරීක්ෂකයෙක්"

දීඝාභය කෝපයෙන් ඉවත බලා ගත්තේ ය. යළිත් සිරිනාග දෙස බලා කතා කළේ ය.

"තොපට අනෙක් තල්පත ලැබුණේ කෙසේද?"

"වෙනත් පරෙවියකුගෙන්, ඌත් දක්ෂ දූතයෙක්." සිරිනාග පැවසුවේ බොරුවක් බව දීඝාභයට වැටහිණි.

දැනටමත් මගේ පරෙයි කූඩුවේ පරෙයියන් තිදෙනෙක් සිටිනවා. සිරිනාග විසින් දීඝාභයටත්, උපතිස්සටත් එල්ල කළේ සියුම් උපහාසයක් බව සභාවට වැටහිණි. රජතුමාගේ මුවගට ද සිනාවක් නැඟිණි.

"වාද විවාද කරගන්නට අවශ්‍ය නැහැ. තුණ්ඩිලගේ පරීක්ෂණ වාර්තාව පැමිණි පසු තීරණයක් ගනිමු. මේ ගැන තවදුරටත් දීර්ඝ ව විමසා බලා සුදුසු තීරණයක් ගැනීමේ වගකීම දීඝජන්තු සෙනෙවිතුමාට පවරනවා."

මහියංගණ විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු නිමවා චෛත්‍ය විශාල කොට බඳවා විහාරමහා දේවිය මහා සංඝරත්නයට පූජා කළා ය. අනතුරුව දුටුගැමුණු රජතුමා, මව් බිසොවුන් සමඟ කඳවුරු බැඳ සිටින බල සේනාවල සුවදුක් විමසන අටියෙන් ගමන් ඇරඹූහ. මුලින්ම ගියේ නන්දිමිත්‍ර සේනාධිපතිගේ කඳවුර වෙත ය. නන්දිමිත්‍ර කඳවුරේ නැත. සෙනෙවිවරු, උපසෙනෙවිවරු යුද්ධ සෙබළුන් ව්‍යායාමයන්හි යෙදීමට පිටත්ව ගොස් සිටියහ.

"නන්දිමිත්‍ර සෙන්පති කඳවුරේ නැද්ද?"

විහාරමහා දේවි මව් බිසොවුන් වහන්සේ ඇසූහ.

"දේවීන් වහන්ස, නන්දිමිත්‍ර සෙනෙවිතුමා දාව ආචාර්යතුමාත් සමඟ අඹතොට බලකොටු සටන් බිමට ගියා. අපේ සෙබළුන් බොහෝ පිරිසකට විස හී සැර වැදී ඇති බව ආරංචි වූ නිසා."

"මෑණියනි, මට මෙහි සෙනෙවියකු සමඟ අඹතොට කඳවුරට යාමට අවසර දෙන්න."

"හොඳයි අපේ අස්රිය ගෙන්වා ගෙන දැන්මම යමු."

අම්බතිත්ථයට පැමිණි දුටුගැමුණු රජතුමා මුලින්ම කළේ සෙබළුන්ගේ සුවදුක් විමසීම ය. ඔවුනට කෙරෙන ප්‍රතිකාර ගැන කඳවුර භාර වෛද්‍යවරයාගෙන් විමසුවේ ය. අනතුරුව කඳවුරු භාර දාඨාසේන මහ සෙනෙවි හමු විය. නන්දිමිත්‍ර මහ සෙනෙවි ද එහි සිටියේ ය.

"මහ රජතුමනි, අම්බතිත්ථ බලකොටුව මහා ජල දුර්ගයක්. මහවැලි ගඟින් හා එයින් හැර වූ ඇළකින් වට වූ එයට ඇතුළු වන්නට යදොරින් හැර වෙනත් තැනක් නැහැ. එතැනට යාමට උත්සාහ කළත්, අපේ සෙබළුන්ට අට්ටාලවලත්, කඳවුරු මුදුනේත් සිටින දුනුවායන් විස හී සැර විදිනවා. පවුරට ඇතුළු වන්නට කිසිදු ලෙසකින්වත් බැහැ."

නන්දිමිත්‍ර මහ සෙනෙවි කීවේ ය.

"කඩොලැතා සමඟ ඇත්සේනාවේ ඇතුන් කිහිප දෙනකු යොදවා බලකොටුවේ දොර බිඳින්න බැරිද?"

"පුළුවන්, නමුත් විස හී සැර වැදී අපේ ඇතුන් ඔත්පල වුණහොත් එය අපේ ඉදිරි සැලසුම්වලට බාධාවක්."

"ඔවුන්ගේ රහස් දොරටු ඇති, අපේ දුර්ගම සංග්‍රාමිකයන්ට සොයාගත හැකි එබඳු දොරටුවක් ගැන විමසිලිමත් වෙන්න." දාව ආචාර්යතුමා කීවේ ය.

"දකුණු පැත්තේ උණ පඳුරක් තිබෙනවා. එතැන ආරක්ෂක ඔරුවක් තියෙනවා. තිත්ථම්බය කඳවරේ සෙනෙවියා පිටතට යන්නේ එතැනින්," එය ඛඤ්ජදේවගේ සොයා ගැනීමක් විය.

"තිත්ථම්භය සෙනෙවියා ගැහැණු සොඬෙක්, ඔහුගෙන් සිංහල , දෙමළ යෞවනියන් සිය ගණනක් විනාශ වෙලා. ඔහුගෙන් තනතුරු, මිල මුදල් ලබා ගැනීමට නම් සෙබළුන් ඔහුට තම ඉලක්ක පාදා දිය යුතුයි." මහනෙල පැවසීය.

"එහෙනම් අපට බැරිද රිදී උණ්ඩයක් පාවිච්චි කරන්න" දාව ආචාර්යතුමාගේ ප්‍රකාශනයෙන් කවුරුත් පුදුමයට පත් වූහ.

"බිළී බෑමක්. ඇමට යොදා ගන්නේ කුමක්ද?"


"දාව ආචාර්යතුමාගේ උපාය වරදින්නේ නැහැ. අපි උත්සාහ කර බලමු." විහාරමහා දේවිය කීවා ය.

"අඹතොට කඳවුර භාර මහ සෙනෙවි දාඨාසේන මාස හතරක් උත්සාහ කළත් බලකොටුව බිඳ ගන්නට බැරිවීම ගැන දුක් වෙනවා.

"දාඨාසේනට බැරිද තරුණියක් ලෙස වෙස් වළාගන්නට?"

"අවශ්‍ය අඳුම් පැළඳුම් තියෙනවා නම් පුළුවන්." දේවීන් වහන්ස,"

"හොඳයි, හෙට දවස යුද කටයුතුවලින් ඈත්ව විවේක ගන්න. ඊළඟ දවස බලකොටුව බිඳීමට සූදානම් වෙන්න. හෙට උදෙන් ම මාත් සමන්තීත් මෙහි පැමිණ දවසම ගත කරනවා."



ඉතිරි කොටස ඉල් අමාවක පෝදු (23) අන්තර්ජාල කලාපයේ පළවේ

අයන්ති විතාන